බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura

| | | | |
|---|---|---|---|
| මගේ අංකය My Number | USJP/EDU 08 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10, Gangodawila නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය Your Number | | | |
| දුරකථනය Telephone | 0113485406 | වෙබ් අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | 011-2802753 | විද්‍යුත් තැපෑල E-mail | ext.certi@sjp.ac.lk |


2026.10.12

# අඩුපාඩු සම්පූර්ණ කිරීම

## 2024/2025 වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය (2023/2022/2021/2020/2019 පුනර්) 2026 ඔක්තෝබර්/නොවැම්බර්

උක්ත පරීක්ෂණය 2026 ඔක්තෝබර් මස මුල සිට ආරම්භ වීමට නියමිත අතර, පරීක්ෂණයට පෙනී සටීමට අපේක්ෂාවෙන් සිටින නමුත්, පහත සඳහන් අඩුපාඩු වලින් එකක් හෝ සහිතව පරීක්ෂණයට අයදුම් කර ඇති සිසුන් 2026.10.19 දිනට පෙර එම අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

අදාළ අවශ්‍යතා සම්පූර්ණ නොකර විභාග සඳහා අයදුම් කර ඇති සිසුන් නිසා විභාග සැලසුම් කිරීමේදී ගැටලුකාරී තත්වයක් මතුවී ඇත. එබැවින් 2026.10.19 දිනට ප්‍රථම එම අඩුපාඩු සම්පූර්ණ නොකරන කිසිවෙකුටත් පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

- විභාගයට අයදුම් කර විභාග ගාස්තු නොගෙවූ සිසුන් (2026.09.28 දින හෝ දිනට පෙර)
- විභාගයට අයදුම් නොකර විභාග ගාස්තු ගෙවූ සිසුන් (2026.09.28 දින හෝ දිනට පෙර)
- නියමිත පරිදි ලියාපදිංචිය දීර්ඝ කර නොමැති සිසුන්
- පාඨමාලා ගාස්තු වාරික සියල්ල සම්පූර්ණ නොකළ සිසුන්

විභාගයට අයදුම් නොකර පරීක්ෂණ ගාස්තු ගෙවූ සිසුන් පමණක් 2026.10.16 දින කාර්යාල වේලාවන් තුල බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට පැමිණ පරීක්ෂණය සඳහා අයදුම් කිරීම සිදුකළ යුතුය. පරීක්ෂණ ගාස්තු, ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තු සහ පාඨමාලා ගාස්තු ගෙවීමට ශිෂ්‍ය තොරතුරු ගොනුව වෙත පිවිස Student හි ඇති Payments මගින් අදාළ ගිණුම් අංක ලබාගෙන එම ගෙවීම් දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් සිදුකළ යුතුය.

**මෙම අඩුපාඩු සම්බන්ධයෙන් සිසුන් වෙත පෞද්ගලික දැනුම්දීමක් සිදු නොකරන අතර 2026.10.19 දිනට අඩුපාඩු සම්පූර්ණ නොකරන සිසුන් පරීක්ෂණය සඳහා පෙනී නොසිටින සිසුන් සේ සලකනු ලැබේ.**

මේ සම්බන්ධව වැඩිදුර විමසීම් සඳහා 011-3485406/ 011-3445302 අංක හරහා කාර්යාලීය වේලාවන්හිදී සම්බන්ධ වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**සැලකිය යුතුයි**

**2019 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි සිසුන් හට උපාධි II පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැකි අවසන් අවස්ථාව මෙය වන බව කරුණාවෙන් සලකන්න.**